# පළාත් හා පළාත් අරමුදල් පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුව

**ඌව පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය**

**2019.07.23 දින**

ඌව පළාත් සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සහ විගණන හා කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්තුමන්, සියලුම ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ගණකාධිකාරීවරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන් සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන ලදී. එසේම කළමනාකරණ සහයක ක්‍රියාවලියක් ලෙසට මෙම විගණන කටයුතු සහ විගණන කළමනාකරණ කටයුතු සිදු කිරීමට හැකිවිය. ඒ සඳහා ජාතික විගණන ආයතනය නියෝජනය කරන සහකාර විගණකාධිපතිතුමන් ඇතුළු විගණන අධිකාරීවරුන් නොමඳ සහයක් ලබාදෙන ලදී. මේ සම්බන්ධව ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව වශයෙන් ගෞරව පූර්වක ස්තූතිය පළකර සිටිමි.

# විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක වීම

- ජාතික විගණන පනතේ 41 (1) වගන්තියේ විධිවිධාන
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධාන
- උඩව පළාතේ ප්‍රධාන ලේකම්තුමාගේ චක්‍රලේඛ උපදෙස් හා විධිවිධාන
- උඩව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් හා නියෝග
- ජාතික විගණන ආයතනයේ උපදෙස් හා මඟපෙන්වීම්

# විගණන හා කළමනාකරණ කමිටුවල සාකච්ඡා කල කරුණු

**01.** අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කර ගැනීම සහ අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳව අනුමැතිය ලබාදීම, ජාතික විගණන පනතේ 40 (1) වගන්තියට අනුව ආයතන මට්ටමින් අභ්‍යන්තර විගණකවරු පත් කර විගණන කටයුතු සිදු කිරීම.

**02.** සේවක මණ්ඩල කළමනාකරණ සහ කාර්ය සාධනය පිළිබඳ සාකච්ඡා කිරීම.

**03.** මූල්‍ය පාලනය, මූල්‍ය වාර්තා සහ ගිණුම් ඉදිරිපත් කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම.

**04.** වත්කම් ආරක්ෂාව සහ වත්කම් පරිපාලනය සහ වාර්තා කිරීම සහ සම්පත් සකසුරුවම් ලෙස භාවිතා කිරීම.

**05.** ආයතන අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලසුම් මෙන්ම එහි ප්‍රගතිය, තිරසර අරමුණු සපුරා ගැනීම පිළිබඳ සාකච්ඡා කිරීම.

**06.** මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(1) හා ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ අංක 10/2010 සහ 4/2012 අනුව උපදෙස් ලබාදී ඇති අනෙකුත් කරුණු

# විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම

- පිහිටුවා ඇති විගණන කමිටු සංඛ්‍යාව - 80

පසුගිය වර්ෂ 04 සිට මේ දක්වා විගණන කමිටු ක්‍රියාත්මක වීම

| වර්ෂය | පවත්වා ඇති කමිටු රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| 2015 | 115 |
| 2016 | 130 |
| 2017 | 157 |
| 2018 | 225 |
| 2019 මේ දක්වා | 71 |

# 2019 වර්ෂයේ මේ දක්වා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම්

| අනු අංකය | ආයතනය | 2019 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| | **01.** පළාත් අමාත්‍යංශ | | | | |
| 1 | **1.** ක්‍රීඩා අමාත්‍යංශය | | 2019.06.19 | | |
| 2 | **2.**කෘෂිකර්ම අමාත්‍යංශය | | 2019.06.06 | | |
| 3 | **3.**මාර්ග අමාත්‍යංශය | | 2019.05.03 | | |
| 4 | **4.**මුදල් (අධ්‍යාපන) අමාත්‍යංශය | | 2019.04.01 | | |
| 5 | **5.**සෞඛ්‍ය අමාත්‍යංශය | | 2019.05.03 | | |
| | | | | | |
| | **02.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාල | | | | |
| 6 | **1.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය | | 2019.07.02 | | |
| 7 | **2.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) කාර්යාලය | | 2019.06.25 | | |
| 8 | **3.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය | | 2019.06.25 | | |
| 9 | **4.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය | | 2019.04.01 | | |
| 10 | **5.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය | | 2019.07.02 | | |
| | | | | | |
| | **03.** අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන් | | | | |
| 11 | **1.** ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය | | | | |
| 12 | **2.** ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | | | 2019.07.02 | |
| 13 | **3.** ඌව පළාතේ සභා ලේකම් කාර්යාලය | | | | |
| 14 | **4.** ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව | | | | |

| අනු අංකය | ආයතනය | 2019 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| | **04.** පළාත් දෙපාර්තමේන්තු | | | | |
| 15 | **1.**අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2019.03.21 | | | |
| 16 | **2.**ආදායම් දෙපාර්තමේන්තුව | | 2019.04.01 | | |
| 17 | **3.**ආයුර්වේද දෙපාර්තමේන්තුව | | 2019.04.09,<br>2019.05.03 | | |
| 18 | **4.**ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | | 2019.04.01 | | |
| 19 | **5.**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | | 2019.07.05 | | |
| 20 | **6.**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | 2019.04.01 | | |
| 21 | **7.**කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | | 2019.06.19 | | |
| 22 | **8.**අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | | | | |
| 23 | **9.**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | 2019.06.06 | | |
| 24 | **10.**මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව | | 2019.05.03 | | |
| 25 | **11.**පළාත් පාලන දෙපාර්තමේන්තුව | | | 2019.07.17 | |
| 26 | **12.**පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව | | 2019.05.03 | | |
| 27 | **13.**සමූපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | | 2019.05.03 | | |
| 28 | **14.**පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | | 2019.05.03 | | |
| 29 | **15.**සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව | | 2019.06.06 | | |
| 30 | **16.**සමාජ සේවා දෙපාර්තමේන්තුව | | 2019.05.03 | | |
| 31 | **17.**වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | 2019.06.06 | | |
| 32 | **18.** ක්‍රීඩා දෙපාර්තමේන්තුව | | 2019.06.19 | | |
| | | | | | |
| | **05.** ආයතන (වෙනත්) | | | | |
| 33 | **1.**ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ- මොණරාගල | | 2019.05.03 | | |
| 34 | **2.**ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ- බදුල්ල | | 2019.05.03 | | |
| 35 | **3.**පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය (කහගොල්ල) | | 2019.04.09 | | |
| 36 | **4.**පැල්ගහතැන්න කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය | | 2019.06.06 | | |
| 37 | **5.**නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය-බදුල්ල | | 2019.06.06 | | |
| 38 | **6.**නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය-මොණරාගල | | 2019.06.06 | | |
| 39 | **7.**පුස්තකාල සේවා මණ්ඩලය | | 2019.04.01 | | |

| අනු අංකය | ආයතනය | 2019 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| | **06.**මූලික රෝහල් | | | | |
| 40 | **1.**දියතලාව | | 2019.05.03 | | |
| 41 | **2.**මහියංගනය | | 2019.05.03 | | |
| 42 | **3.**වැලිමඩ | | 2019.05.03 | | |
| 43 | **4.**සියඹලාණ්ඩුව | | 2019.05.03 | | |
| 44 | **5.**බිබිල | | 2019.05.03 | | |
| 45 | **6.**වැල්ලවාය | | 2019.05.03 | | |
| | | | | | |
| | **07.**කලාප අධ්‍යාපන කාර්යාල | | | | |
| 46 | **1.**බදුල්ල | 2019.03.21 | | | |
| 47 | **2.**බණ්ඩාරවෙල | 2019.03.21 | | | |
| 48 | **3.**බිබිල | 2019.03.21 | | | |
| 49 | **3.**මහියංගන | 2019.03.21 | | | |
| 50 | **4.**පස්සර | 2019.03.21 | | | |
| 51 | **5.**වැලිමඩ | 2019.03.21 | | | |
| 52 | **6.**වැල්ලවාය | 2019.03.21 | | | |
| 53 | **7.**මොණරාගල | 2019.03.21 | | | |
| 54 | **8.**වියලුව | 2019.03.21 | | | |
| 55 | **9.**තණමල්විල | 2019.03.21 | | | |
| | | | | | |
| | **08.**නගර සභා | | | | |
| 56 | **1.**බදුල්ල | | | 2019.07.02 | |
| 57 | **2.**බණ්ඩාරවෙල | | | | |
| 58 | **3.**හපුතලේ | | | | |

| අනු අංකය | ආයතනය | 2019 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| | **09.ප්‍රාදේශිය සභා** | | | | |
| 59 | **1.**බදුල්ල | | | | |
| 60 | **2.**බඩල්කුඹුර | | 2019.04.08 | 2019.07.18 | |
| 61 | **3.**බණ්ඩාරවෙල | | | | |
| 62 | **4.**බිබිල | | 2019.04.08 | 2019.07.18 | |
| 63 | **5.**බුත්තල | | 2019.04.08 | 2019.07.18 | |
| 64 | **6.**ඇල්ල | | | | |
| 65 | **7.**හල්දුම්මුල්ල | | | | |
| 66 | **8.**හාලිඇල | | | | |
| 67 | **9.**හපුතලේ | | | | |
| 68 | **10.** කන්දකැටිය | | | | |
| 69 | **11.**කතරගම | | | | |
| 70 | **12.**ලුණුගල | | | | |
| 71 | **13.**මඩුල්ල | | 2019.04.08 | 2019.07.18 | |
| 72 | **14.**මහියංගනය | | | | |
| 73 | **15.**මැදගම | | 2019.04.08 | 2019.07.18 | |
| 74 | **16.**මීගහකිවුල | | | | |
| 75 | **17.**මොණරාගල | | 2019.04.08 | 2019.07.18 | |
| 76 | **18.**පස්සර | | | | |
| 77 | **19.**රිදීමාලියද්ද | | | | |
| 78 | **20.**සියඹලාණ්ඩුව | | 2019.04.08 | 2019.07.18 | |
| 79 | **21.**සොරණාතොට | | | | |
| 80 | **22.**තණමල්විල | | 2019.04.08 | 2019.07.18 | |
| 81 | **23.**ඌව පරණගම | | | | |
| 82 | **24.**වැල්ලවාය | | 2019.04.08 | 2019.07.18 | |
| 83 | **25.**වැලිමඩ | | | | |

# පසුගිය වර්ෂ කිහිපය තුළ අභ්‍යන්තර විගණනයේ ක්‍රියාත්මක වීම

| වර්ෂය | සිදුකළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| 2015 | 210 |
| 2016 | 251 |
| 2017 | 352 |
| 2018 | 313 |
| 2019.07.18 දිනට | 149 |
| එකතුව | 1275 |

මෙම විගණන වාර්තා සම්බන්ධයෙන් ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සියලුම ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ගණකාධිකාරීවරු සම්බන්ධ කර ගනිමින් අදාළ නිරීක්ෂණ, නිර්දේශ හා යෝජනා ලබා ගනිමින් අභ්‍යන්තර විගණන ප්‍රගති සමාලෝචන සාකච්ඡාවක් පවත්වා, ගත යුතු ඉදිරි පියවරයන් සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇත. 2019.07.17 දින පැවති අභ්‍යන්තර විගණන ප්‍රගති සමාලෝචන සාකච්ඡාවේදී,

# ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය


1. අධ්‍යාපන සංවර්ධන මට්ටම් වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

2. පාසල් ගොඩනැගිලි මනා ලෙස නඩත්තු කිරීම සහ තව දුරටත් අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කර ගැනීමට උපදෙස් ලබාදීම.

3. අනාරක්ෂිත ස්ථාන පිළිබඳව අවධානය යොමු කිරීම සහ පාසල් පරිසරය සහ සෞඛ්‍යාරක්ෂිත භාවය පිළිබඳ අවධානය යොමු කිරීම.







# උව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය

1. ඖෂධ පරිපාලනය පිළිබඳව හා කල් ඉකුත් වූ ඖෂධ ඉවත් කිරීම සම්බන්ධයෙන් පියවර ගැනීම.

2. සීමිත ප්‍රතිපාදන තුළින් සෞඛ්‍ය අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමේදී සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමට මෙන්ම භාවිතා නොවන වෛද්‍ය උපකරණ ආදිය අවශ්‍ය ස්ථාන වලට ලබාදීමට කටයුතු කිරීම.













# උඩරට පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික, සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය

1. සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් යටතේ ඉදිකරන ලද මධ්‍යස්ථාන කඩිනමින් අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීම හා විකල්ප වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු අමාත්‍යාංශය

1. පළාත් මාර්ග සංවර්ධනයේදී I Road ව්‍යාපෘතිය මගින් ඉටු කිරීමට නියමිත මාර්ග පිළිබඳව හා ඒ සඳහා ගිවිසගෙන ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ කර්මාන්ත නිම වන තුරු මාර්ග නඩත්තු කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීම.

2. පළාතේ සංවර්ධනය කල අනෙකුත් මාර්ග ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.









# <u>ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය</u>

1. පළාත් මට්ටමට අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතා ගොවීන් වෙත ලබා දීම සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් තිරසාර වැඩපිළිවෙලක් ඉටු කිරීම.

2. සත්ත්ව පාලනය සම්බන්ධයෙන් බොරලන්ද සත්ත්ව ගොවිපලේ කටයුතු සහ සේවක ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.

3. වාරිමාර්ග ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගොවීන්ට අවශ්‍ය ජල පහසුකම් ලබාදීමේ කටයුතු තවදුරටත් විධිමත් කිරීම හා ක්‍රමානුකූලව අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම.

# නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය

1. ඉදිකිරීම් කටයුතු නිසි ප්‍රමිතියකින් හා උසස් නිමාවකින් සිදු කිරීමට අධීක්ෂණ ක්‍රමවේද පුළුල් කිරීම හා තාක්ෂණ ඇගයුම් කමිටු ක්‍රියාවලියේදී සුදුසුතම කොන්ත්‍රාත්කරුවෙකු නිර්දේශ කිරීමට පියවර ගැනීම.

2. ප්‍රමාදයකින් තොරව අදාළ ප්‍රතිලාභයන් මහජනතාවට ලබාගත හැකි පරිදි නියමිත කාලය තුළ කර්මාන්ත ඉටු කිරීමට පියවර ගැනීම.

# පළාත් විගණන හා කළමනාකරණ කමිටුව 2017



ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමන්ගේ
ප්‍රධානත්වයෙන් සියලුම
ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු
ප්‍රධානීන්ගේ ප්‍රධානත්වයෙන්
**2017.12.27** දින පැවති අවස්ථාවක
විගණකාධිපතිවරයාගේ
නියෝජනයේ කරුණු ඉදිරිපත් කිරීම.



## සාකච්ඡා කල කරුණු

**01.** පළාත් අරමුදල ශක්තිමත් කර ගැනීම සඳහා මූල්‍ය පාලනය, අයවැය පාලනය හා පිරිවැය පාලනය සම්බන්ධ කටයුතු කිරීම.

**02.** නව සහශ්‍ර සංකල්ප මෙන්ම ජාතික හා පළාත් ප්‍රතිපත්ති වලට සමගාමීව ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම හා කාර්ය සාධනය පවත්වාගෙන යාම.

**03.** පළාත් මුදල් රීති, මුදල් රෙගුලාසි, වෙනත් නීතිරීති වල අනුගත වෙමින් විගණන කටයුතු සඳහා ඵලදායී ආකාරයෙන් සහය ලබාදෙමින් මූල්‍ය විචක්ෂණතාවය පවත්වා ගැනීම.

# පළාත් හා පළාත් අරමුදල් පිළිබඳ කමිටු කටයුතු 2018

2018.09.17 දින ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, සහකාර විගණකාධිපති (ඌව), විගණන අධිකාරීවරුන්ගේ (බදුල්ල/ මොණරාගල) සහභාගීත්වයෙන් පළාත් අරමුදල් පිළිබඳ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම ඌව පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී.








SRI LANKA



| අ අං | කරුණු | සාකච්ඡා කළ කරුණු | ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|---|---|
| 01 | ඌව පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්ත මේන්තුව | • විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ කරුණු දක්වන ලදි.<br><br><u>මේ සඳහා නෛතික පදනම ලැබෙන විධිවිධාන</u><br><br>1. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක DMA/ 2009(1) චක්‍රලේඛය<br>2. ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 10/2010 සහ අංක 4/2012 දරණ අභ්‍යන්තර චක්‍රලේඛ<br>3. ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග හා උපදෙස්<br>4. විගණකාධිපති දෙපාර්මේන්තුවේ උපදෙස් හා මඟපෙන්වීම්<br><br><u>චක්‍රලේඛ උපදෙස් පරිදි කමිටු වලදී අවධානය යොමුකරන කරුණු</u><br><br>1. අභ්‍යන්තර විගණන සැලැස්ම<br>2. සේවක මණ්ඩල කළමනාකරණය හා කාර්ය සාධනය<br>3. මූල්‍ය පාලනය සහ ගිණුම් ඉදිරිපත් කිරීම.<br>4. වත්කම් පරිපාලනය සහ වාර්තා කිරීම.<br>5. ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රගතිය සාකච්ඡා කිරීම.<br><br><u>විගණන කමිටු ක්‍රියාත්මක වීම.</u><br>2015 - 115<br>2016 - 130<br>2017 - 152<br>2018 – 106 | කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ විධිවිධාන අනුව ඌව පළාතේ ප්‍රධාන ලේකම් විසින් නිකුත් කර තිබෙන චක්‍රලේඛ විධිවිධාන අනුව මෙම කමිටු ක්‍රියාවලිය පවත්වාගත යුතු බවත් එහි උපදෙස් අනුව පැවැත්විය යුතු අවම විගණන හා කළමනාකරණ සාකච්ඡා පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂවරයාගේ සම්බන්ධීකරණය මඟින් සිදු කරවා ගත යුතු බවත් ඌව පළාත් ප්‍රධාන ලේකම් තුමා විසින් අවධාරණය කරන ලදි. එසේම මූල්‍ය විචක්ෂණතාවය පවත්වාගෙන යාම, නිවැරදි ගිණුම් ඉදිරිපත් කිරීම, විගණන විමසුම් වලින් මතුකරන කරුණු මෙම කමිටු වල සාකච්ඡා කර තම ආයතන වල පාලන පද්ධතීන් නිසි පරිදි මෙහෙයවා ගැනීමේ හැකියාව පිළිබඳවද අදහස් දක්වන ලදි. | සියළුම ආයතන ප්‍රධානීන් හා ආයතන මට්ටමේ විගණන කමිටු |

| අනු අංකය | කරුණු | සාකච්ඡා කළ කරුණු | ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|---|---|
| **02** | අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳ අදහස් දැක්වීම | • අභ්‍යන්තර විගණනයේ ක්‍රියාත්මක වීම හා ඌව පළාත් සභාව යටතේ පවතින ආයතනයන්හි සිදු කරන ලද විගණන පරීක්ෂණ සම්බන්ධයෙන් ප්‍රගතිය ඉදිරිපත් කරන ලදි. | අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සතු කාර්ය මණ්ඩලය තුළින් උපරිම විගණනයක් සිදුවී තිබීම මෙන්ම මෙම කටයුතු ඉදිරියේදී සාකච්ඡා මට්ටමින් තවදුරටත් සිදු කිරීම වැදගත්වන බව පෙන්වා දෙන ලදි. | අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ/ ආයතන ප්‍රධානීන් |

| අනු අංකය | කරුණු | සාකච්ඡා කළ කරුණු | ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|---|---|
| **03** | ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | • සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව යටතේ පවතින බොරලන්ද ගොවිපල ගවයින් මියයාම සම්බන්ධයෙන් සහ ඒ ආශ්‍රිතව සත්ත්ව පාලනය සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු පිළිබඳ අවධානය යොමු වීම.<br>• කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ සිදුවන කෘෂි උපදේශනයේදී ජාතික හා පළාත් ප්‍රතිපත්තීන්ට සමගාමී කෘෂි රසායන අවම භාවිතය කාබනික පොහොර භාවිතය සම්බන්ධව අවධානය යොමු කිරීම. | දෙපාර්තමේන්තු යටතේ සිදුවන මෙවැනි තත්ත්වයන් පිළිබඳ අවධානය යොමු කර අවශ්‍ය තීරණ ගැනීමට දැන්වීම මේ සඳහා අමාත්‍යාංශ මට්ටමේ චක්‍රලේඛ හා උපදෙස් ලබා දීම. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය |

| අනු අංකය | කරුණු | සාකච්ඡා කළ කරුණු | ගන්නා ලද තීරණ | වගකීම |
| --- | --- | --- | --- | --- |
| **04** | ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | • සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අතිකාල වියදම් පාලනය සම්බන්ධයෙන් සලකා බලා සහ රාජකාරියට වාර්තා කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **09/2009** සහ **09/2009 I** හා ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක **4/AD/FM/01/16** හා 2016.09.23 දිනැති ලිපිය පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර හඳුන්වා දීම සහ ඒ ආශ්‍රිත ගැටලු පිළිබඳ අවධානය යොමු කිරීම.<br><br>• ආයුර්වේද දෙපාර්තමේන්තුවට අදාළ හල්පේ පෝෂණ මධ්‍යස්ථානය පවත්වාගෙන යාම<br><br>• සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මූලික අවස්ථාවලදීම විගණනයක් සිදුවන්නේ නම් අඩුපාඩු අවම කර ගැනීමේ හැකියා පැවතීම | • අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර නිශ්ක්‍රීය වියදමක් නොවන ලෙස හැකි මට්ටමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.<br><br>• මෙම ස්ථානය පවත්වාගෙන යාමේ වියදම් හා ආදායම් පිළිබඳ විශ්ලේෂණ වාර්තාවක් ලබාගෙන ඉදිරි තීරණ ගැනීම.<br><br>• අභ්‍යන්තර විගණන වැඩසටහන තුළින් අවශ්‍යතාවය ඉටු කර දීමට සැලසුම් කිරීම. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය / අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ |

| අනු අංකය | කරුණු | සාකච්ඡා කළ කරුණු | ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|---|---|
| **05** | ඌව පළාත් ක්‍රීඩා හා සංචාරක අමාත්‍යාංශය | • සංචාරක සුහපහසු මධ්‍යස්ථානය සම්බන්ධයෙන් කටයුතු කිරීම. | මේ සම්බන්ධයෙන් අදාළ ගාස්තු සංශෝධනය කර ඉදිරි කටයුතු කිරීම සුදුසු බවටත්, එහි මූලික පියවරයන් ආරම්භ කර ඇති බවටත් කරුණු සාකච්ඡා විය. මෙම මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම සඳහා බාධක වශයෙන් හඳුනාගත් කරුණු පිළිබඳව කඩිනම් අවධානය යොමු කර සුදුසු තීරණය ගත යුතු බවත් යෝජනා විය. | ලේකම්, ක්‍රීඩා හා සංචාරක අමාත්‍යාංශය |

| අනු අංකය | කරුණු | සාකච්ඡා කළ කරුණු | ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|---|---|
| 06 | ඌව පළාත් මාර්ග අමාත්‍යාංශය | • මාර්ග අළුත්වැඩියාව සහ ජල සම්පාදන ව්‍යාපෘති හේතුවෙන් මාර්ග පලුදුවීම් සම්බන්ධ අවධානය යොමු කිරීම<br><br>• සමුපකාර ක්ෂේත්‍රයේ සමුපකාර සමිති අක්‍රීය වීම හා ඈවරකිරීම සම්බන්ධ පැන නැගී ගැටලු<br><br>• සමුපකාර අරමුදල සඳහා නියමිත මුදල බැර නොකිරීම සම්බන්ධ ගැටලුව | • මාර්ග දෙපාර්තමේන්තුවේ වැඩසටහන් නියමිත සැලසුමකට අනුකූලව සිදු කිරීමට කටයුතු කිරීම. මෙ සම්බන්ධ වගකීම ප්‍රාදේශීය ඉංජිනේරුවරයෙකු වෙත පැවරීම, ජල සම්පාදන කටයුතු නිසා පලුදුවන මාර්ග පද්ධතිය නැවත සකස් කර ගැනීම සඳහා තැන්පත් මුදලක් ලබා ගැනීමට කටයුතු කිරීම.<br><br>• සමුපකාර දෙපාර්තමේන්තු මට්ටමින් සාකච්ඡා කර අදාළ ගැටලු විසඳා ගන්නා ලෙස අක්‍රීය සමිති නැවත සක්‍රීය කිරීමට අවශ්‍ය විධිවිධාන සමුපකාර පරීක්ෂකවරුන් සහ සමිති භාර නිලධාරීන් මඟින් සිදු කර ගැනීමේ වගකීම පැවරීම.<br><br>• සමුපකාර අරමුදල සඳහා මුදල් බැර කර නොමැති වීම සම්බන්ධයෙන් ප්‍රඥප්තියේ සඳහන් ආකාරයට අදාළ පියවර ගැනීම. | ලේකම්, මාර්ග හා සමුපකාර අමාත්‍යාංශය/ පළාත් මාර්ග අධ්‍යක්ෂ, මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව/ සමුපකාර සංවර්ධන කොමසාරිස්, සමුපකාර දෙපාර්තමේන්තුව |

| අනු අංකය | කරුණු | සාකච්ඡා කළ කරුණු | ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|---|---|
| 07 | ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය | • අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කිරීමේදී එක් ආයතනයකට වාර්තා කිහිපයක් ලබා දීම.<br><br>• ඌව ප්‍රජා ගුවන් විදුලියේ සේවකයින් ස්ථිර කිරීම සම්බන්ධ ගැටලුව සාකච්ඡා කිරීම. | • අභ්‍යන්තර විගණන කටයුතු වලදී සියලුම ආයතන විගණන කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින් තීරණ ගැනීමේ පහසුව සඳහා ආයතන කටයුතු, මූල්‍ය කටයුතු අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් විගණන වාර්තා නිකුත් කිරීමට කටයුතු කල බව විගණන අධ්‍යක්ෂවරයා සඳහන් කරන ලදී. ඉදිරියේදී එම ක්‍රමවේදය වෙනස් කර අදාළ සියලුම කරුණු එක් වාර්තාවකින් ගුණාත්මකව ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම සටහන් කර ගන්නා ලදී.<br>• ඌව ප්‍රජා ගුවන් විදුලිය සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු), රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, අමාත්‍යාංශ ලේකම් යන නියෝජනයෙන් සමන්විත කමිටුවක් තුළින් නිර්දේශ ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට තීරණය කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය/ අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ |

| අනු අංකය | කරුණු | සාකච්ඡා කළ කරුණු | ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|---|---|
| 08 | ඌව පළාතේ සභා ලේකම් කාර්යාලය | විගණකාධිපති දෙපාර්තමේන්තුව නිකුත් කරනු ලබන අවසාන විගණකාධිපති වාර්තාව සභාගත කිරීම සහ වාර්තා පරිවර්තනය කිරීමේදී ඇතිවී තිබෙන තත්ත්වය | මේ පිළිබඳව ඉදිරියේදී සාකච්ඡා කර තිරණ ලබා ගැනීම. | සභා ලේකම්, ඌව පළාතේ සභා ලේකම් කාර්යාලය |
| 09 | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය | පුහුණු කටයුතු සම්බන්ධයෙන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ පුහුණු සැලැස්ම සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය | විශේෂිත වූ පුහුණු අවස්ථා හඳුනාගෙන ඒ සඳහා නියමිත සම්පත් දායකයින් මඟින් ඉදිරි කටයුතු සිදු කිරීම. විශේෂයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා වෘත්තිය මට්ටමේ පුහුණු අවශ්‍ය නම් ලබාදීමේ වැදගත්කම සාකච්ඡා විය. එසේම අනෙකුත් පුහුණු ලබාගන්නා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් අදාළ විෂය රාජකාරී ඉටුකර ගැනීමේදී අදාළ කරගන්නා බවටත් දෙපාර්තමේන්තුගත ආයතන ප්‍රධානීන් විසින් වගබලා ගැනීම වැදගත් වන බවත් සාකච්ඡා කරන ලදී. | සියලුම ලේකම්වරුන්/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) / දෙපාර්තමේන්තු ප්‍රධානීන් |

| අනු අංකය | කරුණු | සාකච්ඡා කළ කරුණු | ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|---|---|
| **10** | රජයේ විගණනය - සහකාර විගණකාධිපති (ඌව) | ඌව පළාත් සභාව තුළ විගණන කටයුතු සම්බන්ධයෙන් යහපත් තත්ත්වයක් නිරීක්ෂණය වන අතර විගණනය විසින් පෙන්වා දෙන කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්තුමා ඇතුලු සියලුම නිලධාරීන් අනුගත වීම යහපත් තත්ත්වයක් බවත් පෙන්වා දෙන ලදි. එසේම ජාතික විගණන පනත සම්බන්ධයෙන් ඉදිරියේදී සියලුම නිලධාරීන් දැනුවත් කිරීමට දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා බවත් ඒ අනුව ඉදිරි විගණන කටයුතු කාර්ය සාධනය, පාරිසරික මෙන්ම යොදවනු ලබන ප්‍රතිපාදන සඳහා මහජනතාව ප්‍රතිලාභ ලබා ගැනීම පිළිබඳ අවධානයට යොමු කරමින් සිදු කරන බවට පෙන්වා දෙන ලදී. | | |

| අනු අංකය | කරුණු | සාකච්ඡා කළ කරුණු | ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|---|---|
| **11** | රජයේ විගණනය - විගණන අධිකාරී, ඌව පළාත් සභාව | මෙහිදී සැලකිය යුතු මට්ටමකින් රාජ්‍ය විගණනය සහ අභ්‍යන්තර විගණන කටයුතු වලදී පෙන්වා දෙන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම සිදුවිය යුතු බවත් විශේෂයෙන් අභ්‍යන්තර විගණනය කළමනාකරණ සහය ක්‍රියාවලියක් වශයෙන් ක්‍රියාත්මක වීමේ වැදගත්කම පෙන්වා දෙන ලදි.<br><br>වර්තමානයේ විගණන හා කළමනාකරණ කමිටු කාර්යභාරය ඉතා සාර්ථකව සිදුවීම අගය කල හැකි කරුණක් බවත් ඒ තුළින් බොහෝ අඩුපාඩු මඟහරවා ගෙන කටයුතු කිරීම සම්බන්ධව විගණකාධිපති වාර්තාව සාක්ෂි දරණ බවත් පෙන්වා දෙන ලදී. මෙහිදී ප්‍රධාන ලේකම්තුමා නිලධාරීන් වෙත නිසි මඟපෙන්වීමක් ලබාදෙන අවස්ථාවන් නිරීක්ෂණය වන්නාසේම විගණනය වෙත සහය දීමේ වැදගත්කම පිළිබඳව විෂය නිලධාරීන් තවදුරටත් අවධානය යොමු කල යුතු බවත් ආයතන මට්ටමින් එකම වරද නැවත නැවත සිදුවීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගැනීම වැදගත් බවත් පෙන්වා දෙන ලදී. | | |

| අනු අංකය | කරුණු | සාකච්ඡා කළ කරුණු | ගන්නා ලද තීරණ | වගකීම |
|---|---|---|---|---|
| **12** | ප්‍රධාන ලේකම්, ඌව පළාත් සභාව | විශේෂ වැදගත් සාකච්ඡාවක් පළාත් හා පළාත් අරමුදල් කමිටුව තුළින් අද දින සිදුවූ බවත් මෙහිදී මතුකල හා සාකච්ඡා කල කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම ඉතා වැදගත් බවත් ප්‍රකාශ කරන ලදී.<br>සියලුම ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් මෙන්ම අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහයෝගය අදාළ කළමනාකරණ මට්ටම්වල කාර්ය සාධනය තුළින් මූල්‍ය විචක්ෂණතාවය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් ආයතනයේ අරමුණු කරා හැකිතාක් දුරට ළඟාවීමට හැකි වූ බවත් පෙන්වා දෙන ලදී. එසේම මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්වයං ඇගයීම් ක්‍රියාවලිය මෙන්ම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පරීක්ෂාවට භාජනය වී ඌව පළාත් සභාවේ ආයතන කිහිපයක් ඇගයීමට ලක්වීම ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා වශයෙන් අතිශයින් අගයකරන බවත් දන්වා සිටින ලදී.<br>ඒ අනුව මෙම වර්ෂය අවසානයේදී සියලුම අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටු සාකච්ඡා වලින් පසු මීළඟ පළාත් අරමුදල් පිළිබඳ කමිටුව පැවැත්වීම සුදුසු බවත් එම සාකච්ඡාව මීට වඩා ප්‍රශස්ථ සාකච්ඡාවක් බවට පත්කර ගැනීමට සියලුම දෙපාර්තමේන්තුවල සහය බලාපොරොත්තු වෙමින් සාකච්ඡාව සඳහා සහභාගී වූ සියලුම නිලධාරීන්ට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්ට ස්තූතිය ප්‍රකාශ කරමින් සාකච්ඡාවේ කටයුතු අවසන් කරන ලදී. | | |

# 2018.12.20 දින පැවැත් වූ පළාත් විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡා වූ කරුණු වගකීම හා වර්තමාන ප්‍රගතිය





| ආයතනය | කරුණු | කමිටුවේ නිර්දේශය | වගකීම | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|---|
| ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා නියෝග පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර ක්‍රියාත්මක කිරිම. | සේවක විනය පවත්වා ගැනීම මෙන්ම වියදම් පරිපාලනය සම්බන්ධව වැදගත් හඳුන්වාදීමක් බැවින් අනිවාර්යෙන්ම ක්‍රියාත්මක කිරීම. | ඌව පළාත් සෞඛ්‍ය ලේකම්/ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | සියලුම ආයතනවල ඇගිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාත්මක වේ. ක්ෂේත්‍ර කිහිපයක මෙහි තම අනන්‍යතාවය ප්‍රකාශ කිරීම සිදු නොවන බැවින් ඒ පිළිබඳව සාකච්ඡා මට්ටමින් කටයුතු සිදු වේ. මේ සම්බන්ධව ජාතික මට්ටමේ නිර්ණායක අවශ්‍යතාවය පවතී. |
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) කාර්යාලය | වියදම් පරිපාලනය | චක්‍රලේඛ උපදෙස් වලට අනුගතවීම සහ ආයතන මට්ටමින් වියදම් පාලන ක්‍රම අනුගමනය කිරිම. | සියලුම ආයතන ප්‍රධානීන් / ගණකාධිකාරීවරු | වියදම් පාලනය සැලකිය යුතු මට්ටමින් සිදුවේ. අතිකාල වියදම් තවදුරටත් පාලනය කර ගැනිමේ අවශ්‍යතාවය පවතී. සැබෑ ලෙසම අතිකාල සේවයේ යෙදන බවට බොහෝ ආයතනවල අධීක්ෂණ ක්‍රියාවලියේ අඩුපාඩු පවතී. |

| ආයතනය | කරුණු | කමිටුවේ නිර්දේශය | වගකීම | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|---|
| ඌව පළාත් මාර්ග හා ද්‍රවිඩ පාසල්, සමුපකාර අමාත්‍යාංශය | ද්‍රවිඩ පාසල් සංවර්ධන කටයුතු හා වියදම් දැරීමේ අධිකාරි බලය සම්බන්ධව | මාර්ග අමාත්‍යාංශය, පළාත් දෙපාර්තමේන්තුව ඒකාබද්ධව අදාළ සැලසුම් අංශයද සහභාගීත්වයෙන් අදාළ ගැටළු විසදා ගැනිම. | ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | උපදෙස් පරිදි කටයුතු කිරීම සිදුවේ. |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව | උසස් වීම්, සේවාවල පිහිටුවීම්, පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීනව ඉදිරිපත් නොකිරිම මත ආපසු ඒවා අඩුපාඩු සම්පුර්ණ කර ගැනීමේ දී ප්‍රමාදයන් සිදු වීම. | නියමිත පරිදි අඩුපාඩු රහිතව ලිපිගොනු පවත්වා ගැනිම හා යැවීම ඉතා වැදගත් බැවින් ඒ සම්බන්ධව විශේෂ අවධානය යොමු විය යුතු වේ. | ආයතන ප්‍රධානීන්/ පරිපාලන නිලධාරින් | මේ සම්බන්ධව කොමිෂන් සභාව විසින්ද චක්‍රලේඛ උපදෙස් ලබා දීම, තවදුරටත් එවැනි තත්වයන් සිදු වන බවට අනාවරණය වීම. |
| කෘෂිකර්ම, ක්‍රීඩා, අධ්‍යාපන අමාත්‍යාංශ | ප්‍රතිපාදන හා අක්මුදල් ප්‍රමාණවත් නොවිම. | වියදම් පාලනය කර ගනිමින් කටයුතු කිරිම සහ අක්මුදල් අවශ්‍යතා ඉදිරියේ දී ලබා දීමට කටයුතු කිරිම. | ලේකම්වරු න්/ ගණකාධිකාරී වරුන් | අක් මුදලින් කොටසක් ලබා දී ඉතිරි බිල්පත් මෙම වර්ෂයේ මුල් කාර්තුවේ ගෙවීම් කිරීම. |

මේ අනුව මෙම කරුණු ඉදිරිපත් කිරීම තුළින් විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාවලියේ මෙන්ම අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ යම් සංශෝධන හෝ වැඩිදියුණු කිරීම් සඳහා ඔබ සියලු දෙනාගේ අදහස් ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර මෙම සාකච්ඡාව සඳහා විවෘතව සක්‍රියව සම්බන්ධ වන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

# ස්තූතියි..!